**නාගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
-------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
---------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු උසාවි දඩ රු.779,771 ක් අඩුවෙන් සහ වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.969,783 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.113,760 ක් ගිණුම් ගතකර නොතිබුණි. | ලැබිය යුතු මුදල ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල රු.30,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (iv) සමාලෝචිත වර්ෂයේ දී රු.46,520 ක භාණ්ඩ මිලදී ගැනීම් පුනරාවර්තන වියදම් ලෙස වැය ශීර්ෂ මාරු කර සටහන් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.49,944,320 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.18,315 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) **ලැබිය යුතු ගිණුම්** | | |
| * සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,011,519 ක් වූ හිඟහිටි පොළ බදු ශේෂයෙහි වූ 2016, 2017 වර්ෂයන්ට අදාළ රු.1,073,519 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වල සිට එන ශේෂ අයකර ගතයුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| * මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් රු.5,060,809 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වල සිට එන ශේෂ අයකර ගතයුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

(ii) **ගෙවිය යුතු ගිණුම්**

| | | |
|---|---|---|
| * ණයහිමි ශේෂය තුළ වසර ගණනාවක සිට පැවත එන එකතු වටිනාකම රු.8,359,121 ක් වූ ණය ශේෂ 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වල සිට පැවත එන ශේෂ නිරවුල් කරගත යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |
| * 2011 වර්ෂයේ සිට 2017 දක්වා කාලපරිච්ඡේදයට අදාළ එකතු වටිනාකම රු.1,368,296 ක් වූ ගෙවිය යුතු රජයේ ආධාර නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | පෙර වර්ෂ වල සිට පැවත එන ශේෂ නිරවුල් කරගත යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

**(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.166,180,709 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(2) වගන්තිය | 1,005,877 | 1999 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | කඩිනමින් විගණන ගාස්තු නිරවුල් කළ යුතු වේ. | මහා සභා රැස්වීම් තීරණ අනුව මාසිකව රු.10,000 බැගින් ගෙවමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,396,110 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,013,416 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 64,000 | 65,812 | 4,093 | 336,386 | 65,000 | 65,553 | 21,320 | 274,666 |
| කුලී | 3,498,380 | 3,531,600 | 2,823,700 | 2,533,969 | 3,512,720 | 3,497,720 | 2,520,948 | 1,841,037 |
| බලපත්‍ර ගාස්තු | 450,000 | 1,028,522 | 906,072 | 122,450 | 600,000 | 763,018 | 763,018 | - |
| | 4,012,380 | 4,625,934 | 3,733,948 | 2,992,805 | 4,177,720 | 4,326,291 | 3,305,286 | 2,115,703 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.2,115,703 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.4,625,934 ක් විය. ඒ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.6,741,637 ක් වූ අතර, වර්ෂය තුළ රැස්කිරීම් රු.3,733,948 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 55 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3** **වරිපනම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව වරිපනම් කළාප ප්‍රකාශයට පත් කර, වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධිත ප්‍රදේශ සඳහා වරිපනම් බදු අයකළ යුතු වේ. | සමීක්ෂණයක් සිදු කර වරිපනම් පිළිබඳව හඳුනා ගැනීමට කටයුතු කරමි. |

**2.2.4** **අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයකර ගතයුතු අක්කර බදු මුදල රු.340,478 ක් වුවද, රැස් කළ ආදායම රු.4,093 ක් වීමෙන් අයවීම සියයට 1.2ක අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. | හිඟ අක්කර බදු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් කට්ටි කිරීම සිදු කර ඇති නිසා කට්ටි කළ ඉඩම් හඳුනාගෙන අය කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5** **බදු කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයකර ගතයුතු මුළු ආදායම රු.5,372,637 ක් වූ අතර, ඉන් සමාලෝචිත වර්ෂයේ මුළු අයකිරීම් රු.2,823,783 ක් වීමෙන් අය කිරීම් ප්‍රතිශතය සියයට 53 ක්ව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ බදු කුලී ආදායම් අය කර ගැනීම සිදු කරමින් පවතී. |

**2.2.6** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,120,229 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,060,809 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | උසාවි දඩ රු.214,120 ක් ද මුද්දර ගාස්තු රු. 578,396 ක් 2019 වර්ෂයේ අය කර ගෙන ඇත. ඉතිරි මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 හා 2017 වර්ෂවලදී කර්මාන්ත 02 ක් වෙනුවෙන් ලැබී තිබූ රු.55,000 ක මුදලක් අදාළ කාර්යය සඳහා යොදවාගෙන නොතිබුණි. | සභාවේ අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කරමි. |

**(ආ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා | බල ප්‍රදේශයේ මහජනතාවගේ | දිගු කාලීන සැලැස්මක් ඇත. |

| | | |
|---|---|---|
| වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නැංවීම සඳහා දිගු කාලීන සැලසුම් සකස් කළ යුතු වේ. | මේ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කරමි. |

(ඈ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| උඩුගම ඇප්තොප්වත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කසළ කළමනාකරණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.612,500 ක් වැයකර තිබුණු අතර, කොම්පෝස්ට් නිෂ්පාදන අලෙවියෙන් රු.66,168ක ආදායමක් උපයාගෙන තිබුණි. එසේ වුවද, මෙම භූමියේ අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, භූමියට පරිසර බලපත්‍රයක් ද ලබාගෙන නොතිබුණි. | භූමියේ අයිතිය සභාවට පවරා ගැනීම හා පරිසර බලපත්‍රයක් ලබා ගතයුතු වේ. | ඉදිරියේ දී අයිතිය පවරා ගෙන බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

(ඈ) **ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, එය ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුගත විය යුතු වේ. | 2018 වර්ෂයේ සිදු වූ හදිසි ආපදා තත්ත්වය නිසා සාර්ථකව ක්‍රියාක්මක කිරීමට නොහැකි විය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත සංඛ්‍යාව ඉක්ම වූ අතිරික්ත සේවක සංඛ්‍යාව 24 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 17 ක් විය. | කාර්ය මණ්ඩල සැලැස්මට අනුව කටයුතු කළ යුතු වේ. | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත්, පුරප්පාඩු සඳහා බඳවා ගැනීමටත් කටයුතු කරමි. |
| (ii) | 2006 අප්‍රේල් 01 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවී බඳවා ගන්නා ලද සේවකයින් 07 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.1,400,056 ක් වැටුප් හා දීමනා වශයෙන් සභා අරමුදලින් ගෙවා තිබුණි. | කාර්ය මණ්ඩල සැලැස්මට අනුව කටයුතු කළ යුතු වේ. | 25/2014 චක්‍රලේඛය අනුව බඳවා ගැනීම සිදු කර ඇත. |
| (iii) | අනුමත පෙර පාසල් පාලිකා තනතුරු සංඛ්‍යාව 03 ක්ව තිබිය දී උක්ත චක්‍රලේඛ යටතේ 11 දෙනෙකු බඳවාගෙන තිබුණි. ඊට අමතරව කොන්ත්‍රාත් පදනම මත තවත් 03 දෙනෙකු බඳවා ගැනීම නිසා අතිරික්ත පෙර පාසල් පාලිකා තනතුරු සංඛ්‍යාව 14 ක් වී තිබුණි. | අනුමත පරිදි සේවකයින් බඳවා ගත යුතු වේ. | අනුමත සේවක සංඛ්‍යාව වැඩිකර ගැනීමට ඉල්ලා ඇත. |
| (iv) | සභාවට අයත් එකම ආයුර්වේද මධ්‍යස්ථානය වූ මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානයේ ඖෂධ සංයෝජක තනතුර පුරප්පාඩුව තිබුණි. | පුරප්පාඩු පිරවිය යුතු වේ. | ඉදිරියේ දී බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (v) | සභාවේ සේවකයින්ට තනතුරට අදාළ රාජකාරිවලට වඩා ඉහළ තනතුරුවල රාජකාරි පවරා දී තිබුණි. | තනතුරට අදාළ රාජකාරි පැවරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු දී නොමැත. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**(අ) වාහන සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ ආවරණ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1951 අංක 14 දරන මෝටර් රථ ආඥා පනත පරිදි වාහනයක් මාර්ගයේ ධාවනය කිරීමට ආදායම් බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වුවත්, සභාව සතු වාහන 04ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර, රක්ෂණ ආවරණ ලබා නොගෙන වාහන ධාවනයේ යොදවා තිබුණි. | ආදායම් බලපත්‍ර හා රක්ෂණාවරණ ලබා ගත යුතු වේ. | වාහන 02ක් සඳහා රක්ෂණ සහතික ලබාගෙන ඇත. |

**(ආ) කඩ කාමර බදුදීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) මාපලගම පැරණි කඩ කාමර 04 ක් සහ තල්ගස්වල කඩ කාමර 05 ක් සභාව සතුව පැවතිය ද, අයිතිය සනාථ කිරීමට ඔප්පු නොතිබුණි. කඩ කාමර 06 කින් බදු දීමේ දී බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | නිසි පරිදි බදු ගිවිසුම් අත්සන් කර හිඟ මුදල් අය කර ගත යුතු වේ. | කඩ කාමර 02ක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇත. හිඟ මුදලින් කොටසක් අයකර ගෙන ඇත. |
| (ii) මාපලගම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 ක් සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | නිසි පරිදි බදු ගිවිසුම් අත්සන් කර හිඟ මුදල් අය කර ගත යුතු වේ. | කඩ කාමර 02ක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇත. හිඟ මුදලින් කොටසක් අයකර ගෙන ඇත. |

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයේ එකතුව රු.16,941,945 ක් වූ අතර, එම වටිනාකම සියයට 22 ත් සියයට 51 ත් අතර විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |
| (ආ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු.13,666,010 ක් වූ ඉතිරිවීම් වූ අතර, එම වටිනාකම් සියයට 30 සිට සියයට 91 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |